පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) යන්ත්‍ර උපකරණ යටතේ ගිණුම්ගත විය යුතු වටිනාකම රු.873,196 ක්, ලී බඩු හා සවි කිරීම් ගිණුමට හර කර තිබුණි.

(ආ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.3,284,446 ක් වුවද, ශේෂ පත්‍රයේ එය රු.2,860,475ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයට අදාල ණයහිමියන් රු.423,971 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් යටතේ 2011 හා 2013 වර්ෂ සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස රු.8,669,729 ක් දක්වා තිබුණද තත්‍ය ලෙස සමාලෝචිත වර්ෂය අවසානවන විට එකී කාලයට අදාල හිඟ මුද්දර ගාස්තු ශේෂයක් නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 04 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අතර රු .4,326,119 ක නොසැසඳීම් පැවතුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.67,738,020 ක් විය. ඉන් රු. 3,488,367 ක ශේෂයක් හඳුනාගත නොහැකි විය. ඉන් දළ වශයෙන් සියයට 8 ක් ලෙස රු.5,217,681 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.23,452,554 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.13,902,422 ක් වීමෙන් මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.9,550,132 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.58,290,846 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.82,569,576 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.826,176 ක ඌනතාවයක් බවට පත්ව ඇත.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.109,248,991 න් දළ වශයෙන් සියයට 52 ක් ලෙස රු.57,034,237 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.58,290,846 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.85,796,437 න් දළ වශයෙන් සියයට 52 ක් ලෙස රු.44,303,011 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර ඉන් දළ වශයෙන් සියයට 96 ක් ලෙස රු.42,517,413 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.82,569,576 න් දළ වශයෙන් සියයට 29 ක් ලෙස රු.24,278,730 ක් පමණක් සභා අරමුදලින් වැය වී තිබුණු අතර දළ වශයෙන් ඉතිරි සියයට 71 ක් වූ රු.58,290,846 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.1,958,137 ක් වූ අතර මුද්දර ගාස්තු ප්‍රමාණය රු.10,118,014 ක් විය.

#### 2.3.2 බදුකුලී හා පොල බදු

(අ) කඩ කුලී නියමිත දිනට අය කිරීම සඳහා කටයුතු නොකිරීම මත රු.339,120 ක කඩ කුලී හිඟයක් අය කර ගැනීම සඳහා පුද්ගලයින් තිදෙනෙකුට විරුද්ධව නඩු පැවරීමට සභාවට සිදු වී තිබූ අතර එම පුද්ගලයින් වර්තමානයේදී විදේශගත වීම මත එම හිඟ කුලී අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) බණ්ඩාර කොස්වත්ත, හෙට්ටිපොල සතිපොල හා බුලත්පොල යන පොලවල්වලට අදාල පොල ගාස්තු අය කිරීම විධිමත්ව සිදු කර නොතිබූ අතර ඒවායේ වර්ග ප්‍රමාණය හා ව්‍යාපාර ස්භාවය අනුව අය කල හැකි ගාස්තු ප්‍රමාණය අනුමත කර ඇති බවත් නිරීක්ෂණය නොවීය.

(ඇ) ආසියානු සංවර්ධන ව්‍යාපෘති ආධාර යටතේ රු.41,128,218 ක් වැය කර 2011 වර්ෂයේ ඉදිකර තිබූ බහු කාර්ය ගොඩනැගිල්ලෙහි පැවති කඩ කාමර 09 ක් සඳහා 2014 වර්ෂය අවසානවන විටද කුලී තක්සේරු වාර්තා ලබාගෙන නොතිබුණි.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධන ඇගයීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂය තුල ගමින් ගමට දොරින් දොරට ප්‍රතිපාදන රු.3,100,000 යටතේ ක්‍රියාත්මක කිරීමට අනුමත ව්‍යාපෘති 12 ක් වර්ෂය තුල ඉටු කිරීමට අපොහොසත් වීම නිසා එම අරමුදල් සභාවට නොලැබී තිබුණි.

(ආ) සභාව විසින් 2014 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර අය වැය යෝජනාවලට ඇතුලත් කරන ලද පිරිවැය රු.6,500,000 ක් වූ ප්‍රාග්ධන ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) සභාවේ දේශපාලන අධිකාරිය විසින් 2014 පෙබරවාරි 23 සිට 28 දක්වා එක් මන්ත්‍රීවරයෙක් ඉන්දුනීසියාවටද 2014 අගොස්තු 24 සිට 29 දක්වා මන්ත්‍රීවරු 07 දෙනෙකු මැලේසියාවටද 2014 ඔක්තෝබර් 18 සිට 23 දක්වා මන්ත්‍රීවරු 10 දෙනෙකු තායිලන්තයටද වශයෙන් විදේශ සංචාරවල නිරත වී තිබූ අතර ඒ සඳහා සභා අරමුදලින් රු.2,645,912 ක් වැය දරා තිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් 2010 වර්ෂයේ සිට භාවිතා කරනු ලබන අංක 53-6109 දරන කැබ් රථයේ අයිතිය පවරාගෙන ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන්වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට අයනොවී පවතින දැනට සේවයේ නොමැති සේවකයින් 17 කගේ සේවක ණය ශේෂය රු.46,218 ක් විය.

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) සභාවට පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු වාහන 03 ක් 2015 ජූනි මස වන විටත් ලියාපදිංචි කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 ජූලි මස 10 දින එකක් රු.137,750 බැගින් රු.275,500 ක් වැය කර මිලට ගෙන තිබුණු කුට්ටි ගල් නිෂ්පාදන යන්ත්‍ර දෙක හා කුට්ටි ගල් ඇතිරීම සඳහා 2012 ඔක්තෝබර් 30 දින මිලට ගෙන තිබුණු 24 x 16 ප්‍රමාණයේ රු.124,500 ක් වටිනා ලෑලි තට්ටු 415 ක් භාවිතයට නොගනිමින් පැවතුණු අතර අදාල යන්ත්‍ර වල වගකීමේ කාල සීමාව භාවිතයෙන් තොරවම අවසන්ව තිබුණි.

04 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). අයවැය පාලනය
(ඇ). වත්කම් කළමනාකරණය
(ඈ). කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ). වාහන පාලනය